60

# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය
### (බාහිර) - 2008

### මානවශාස්ත්‍ර පීඨය

### සිංහල - SINH – E2015

### සිංහල ගද්‍ය සාහිත්‍යය, නාට්‍ය හා සිනමා

**එක් කොටසකින් එක් ප්‍රශ්නයක් බැගින් වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි** **කාලය : පැය 03 යි**

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

1 කොටස

1. පහත සඳහන් ඡේදය ලිහිල් බසින් ලියා බුත්සරණ කතුවරයා චරිත නිරූපණයෙහි දී දක්වූ කුසලතාව පිරික්සන්න.

තව ද දහසක් අඟිලි කපා ගුරු පූජා කෙරෙමි, මහ වතට බැසැ යමයාගෙ දළ සෙ, භයංකර වූ කඩුවක් ගෙනැ වාත වේගයෙන් දිවැ මිනිසුන් මරා, ඇඟිලි කපා, ගෙතූ ඇඟිලි කරලීමෙන් අංගුලිමාල යැ'යි ප්‍රසිඬ ව 'මම ය අංගුලිමාල' යැයි කී හඬ ඇසූ විට මැ මහ සෙන හඬ ඇසූ මුව පොල්ලන් සෙ, කෙශර සිංහ නාද ඇසූ ඇත් පැටවුන් සෙ, මනුෂ්‍යයන් තතුනුවමින් මනුෂ්‍යරූප ගත් කල්පාන්ත වහ්නියක් සෙ, ඉතා චණ්ඩ වැ හිසැ සිසාළ කඩුවෙන් යුක්ත වැ දිවෙන භයංකර වෙශය බලා ඉවසියැ නොහී දෙ අතින් දැස් පියා මුහුණින් හුන් මිනිසුන් මරා ඇඟිලි කපමින්, ඇතුන් හඹා දිවැ වාලධියෙන් ගෙනැ ඇද රඳවා කඩු පහරින් දෙකඩ කොටැ, අසුන් ලුහුබැඳැ වීරිතියෙහි ගෙනැ හිස සිසාරා පොළොවැ අපුළා තුතු කෙරෙමින්, ඇත් පයට හසු වූ මළ පරඬලා සේ රථ මැඩැ සුණු විසිණු කෙරෙමින්, ලෙහෙයින් රත් වූ අතැති වැ ගම් නොගම් කොටැ, නියම්ගම් නොනියම් ගම් කොටැ, නුවර අනුවර කොටැ, ඇවිදිනා කල්හි මෙපවත් ඇසූ කෝශලයන් තමන්ගෙ සිවුරඟ සෙනඟ ගෙන 'මම සෙට ගොස් ගන්මි'යි නිශ්චය කළ දවස් එ සොරහුගේ මව් බැමිණිය 'මම ගොස් ම පුත්හු මරින් ගලවා ගෙනෙමි' සිටි කල්හි බුදුහු එදවස් අලුයම් වේලෙහි මහා කරුණා සමාපත්තියෙන් නැඟී 'අද මාගේ සඬර්මය අසා අමාමහ නිවන් දක්නට සුදුස්සො කවුදෝ හො'යි සියලු ලොව නුවණැසින් බලා අංගුලිමාලයා දැකැ 'අද මම එසොරු කරා නොගියෙම් නම්, හෙතෙමේ තමා රක්නට ගිය මෑණියනුදු මරා ඇඟිලි කපා ගෙන බුදුන් දහසකුදු ගලවා ගත නොහැකි පරිද්දෙන් අවිචියෙහි නස්නෙ යැ.

2. 'පැරණි සිංහල කථා කලාවේ සාධනීය ලක්ෂණ නූතන කෙටිකථාවෙහි ද පිළිබිඹු වේ' සඬර්මරත්නාවලියේ ඔබ කැමති කථා වස්තු දෙකක් ආශ්‍රයෙන් පූර්වොක්ත ප්‍රකාශයේ සත්‍යාසත්‍යතාව පැහැදිලි කරන්න.

**නැතහොත්**

"<u>සද්ධර්ම රත්නාවලිය</u> කතුවරයාගේ පරමාර්ථයට අනුව රචිත ග්‍රන්ථයකි." සාකච්ඡා කරන්න.

3. 'පැරණි සිංහල ගද්‍ය සාහිත්‍ය රචකයන්ගේ මූලික අභිප්‍රාය වූයේ ආනන්දයෙන් ප්‍රඥව ජනිත කිරීම යි' ආරම්භයේ සිට දඹදෙණි යුගය දක්වා වූ ගද්‍ය නිර්මාණ ඇසුරෙන් මේ ප්‍රකාශය විභාග කරන්න.

**නැතහොත්**

"පැරණි සිංහල ගද්‍ය සාහිත්‍යය වඩාත් නැඹුරු වූයේ ලෝකෝත්තර පක්ෂයටයි." විමසන්න.

## 2 කොටස

4. "නූතන ප්‍රබන්ධ කථා සාහිත්‍යය ප්‍රවර්ධනයෙහි ලා බටහිර සාහිත්‍යය ප්‍රමුඛ වූයේ ය" යන ප්‍රකාශයෙහි යුක්ති යුක්ත භාවය පැහැදිලි කරන්න.

**නැතහොත්**

'බැද්දේගම පරිහානියට අවතීර්ණ වූයේ ස්වාභාවික හේතු ප්‍රත්‍යයන්ගේ බලපෑමෙන් පමණක් ම නො වේ.' විමසන්න.

5. පහත සඳහන් කෙටිකථාවලින් <u>එකක (01)</u> කලාත්මක අගය පිළිබඳ විවරණයක් කරන්න.

අ. තාපපටලය
ඉ. නිවුණු තේ කෝප්පය
උ. උරුම් කරුමය

## 3 කොටස

6. ථෙරවාද බුදුසමයේ බලපෑම නිසා දියුණු සිංහල කලාවක් ඇති නො විණි යැයි සරච්චන්ද්‍ර ඉදිරිපත් කර ඇති මතයෙහි සත්‍යාසත්‍යතාව විමසන්න.

7. 'සුප්පා දේවිය දාරක ස්නේහය හා පති භක්තිය අතර පීඩනයට පත් වන්නේ තමන් විසින් ම ගන්නා ලද තීරණ හේතුවෙනි' විමසන්න.

8. කෝලම් නාටකයෙන් හෙළිවන සිංහල ජන ජීවිතය පිළිබඳ විවරණයක් කරන්න.

**නැතහොත්**

සිංහල කවි නළු සම්ප්‍රදායෙහි ප්‍රභවය අරභයා වන විවිධ මත පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

9. 'චිත්‍රපටය වඩාත් සමීප වන්නේ නාට්‍ය කලාවට නො ව නවකතාවට ය' විමසන්න.

10. සිනමාව වාර්තික කලාවක් වශයෙන් සලකනු ලබන්නේ කවර හෙයින් දැයි නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

**************************